

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 - සති පාසැල් වැඩ සටහන
නර්තන විෂය
13 වසර



නිපුනතාව - 8.1 :- නර්තන කලාව හා සබැඳි අනුෂංගික අංග පිළිබඳ තොරතුරු

නිපුනතා මට්ටම - ශාන්තිකර්ම හා සබැඳි අනුෂංගික අංගයක් ලෙස සරසිලි , පසුකළ සැළසුම්කරණය හා රංග උපකරණ භාවිතය පිළිබඳ තොරතුරු රැස්කරමු.

- හිස්තැන් පුරවන්න.

01. ශාන්තිකර්මයට සුදුසු ආකාරයෙන් නියම කරගත් භූමිය සරසා සකසා ගත් පසු එම භූමියට ................................... යැයි කියනු ලැබේ.
02. ත්‍රිත්ව සම්ප්‍රදායෙහි එන පහත රට නර්තන සම්ප්‍රදායේ උප ශෛලීන් ලෙස ................................... හා ................................... ශෛලීන් වේ.
03. ශාන්ති කර්මය කාව්‍ය සාහිත්‍යයේ එන සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව ශාන්තිකර්ම මඬුවේ දිගින් ................................... රියනක් හා පළල ................................... රියනකි.
04. උඩරට නර්තන සම්ප්‍රදායේ කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිල්ල ලෙස ................................... හැඳින්විය හැකිය.
05. කුමාර වීදිය ත්‍රිත්ව සම්ප්‍රදායට අයත් ................................... නර්තන සම්ප්‍රදායේ ශාන්ති කර්ම සැරසිල්ලකි.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම සැරසිල්ලකි.
    i. මුවය සහිත කෙසෙල් ගස
    ii. අයිලය
    iii. සුනියම් වීදිය
    iv. කුමාර වීදිය
02. මෙම ශාන්ති කර්ම සැරසිලි අතුරින් රංග උපකරණයක් නොවන්නේ කුමක්ද?
    i. ගගගග වවුන්න
    ii. පොල් පන්දම
    iii. සුන්න හා ඊගස
    iv. කත්තිරික්කය
03. ශාන්තිකර්ම සැරසිලි අතර දක්නට ලැබෙන කැටයම් විශේෂයකි.
    i. ගොක්කොළ කැටයම්
    ii. ලී කැටයම්
    iii. වාස්තු කැටයම්
    iv. පසාරු කැටයම්
04. 'රජ කුලයට සැක රියනයි '
    ....................................................
    වෙළඳ කුලට තිස් රියනයි
    ගොවිකුලයට හත් රියනයි
    හිස්තැනට ගැලපෙන කවි පදය වනනේ,
    i. දිගින් මඬුව සැට රියනයි
    ii. පුළුලින් ඒ තිස්න රියනයි
    iii. බමුණු කුලට තිස් රියනයි
    iv. කලෝ මඬුව මේ ලෙසටයි
05. කොහොඹා කංකාරි ශාන්කර්මයේ බොහෝ රංගන අවස්ථාවල භාවිතා වන රංග භාණ්ඩයකි.
    i. දෙකොන විලක්කුව
    ii. නවකොළ අත්ත
    iii. පොල් පන්දම හා ඊගස
    iv. අත් පන්ද

## II කොටස

01. ශාන්ති කර්මවල භාවිත පසුකළ සැලසුම්කරණ හා රංග උපකරණ 04 බැගින් නම් කරන්න.
02. රංග උපකරණ සකස් කිරීමේදී භාවිතා කරන සාම්ප්‍රදායික ක්‍රමවේදයක් පිබඳව විස්තර කරන්න.
03. ශාන්ති කර්මයෙහි අන්තර්ගතය මතු කර දැක්වීමට පසුතල සැලසුම්කරන හා රංග උපකරණ භාවිත වන ආකාරය පිළිබඳ විස්තර කරන්න.

සැකසුම : ඒ. ඩී.සී. අතුරලිය

ශ්‍රී මහින්ද මහා විද්‍යාලය